# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

## ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සඳහා ට්‍රාන්ස්ෆෝමර් කාමරය සහ ජල ටැංකි කාමරය ඉදි කිරීම

**කොන්ත්‍රාත් අංකය : SLADA/PRO - W01**

1. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින්, පහත විස්තර කර ඇති පරිදි සහ වැට් බදු (VAT) හැර ආසන්න වශයෙන් රුපියල් මිලියන 14 ක් වැය වේ යැයි ඇස්තමේන්තු කර ඇති ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සඳහා ට්‍රාන්ස්ෆෝමර් කාමරයක් සහ ජල ටැංකි කාමරයක් ඉදි කිරීමේ (කොන්ත්‍රාත් අංකය: SLADA/PRO -W01) කාර්යය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු මෙයින් කැඳවනු ලැබේ.

   මෙම කාර්යය දැනට පවතින ගොඩනැගිලි කොටස් ඉවත් කිරීම සහ වර්ග අඩි 600 ක පමණ සමස්ත ගොඩනැගිලි වර්ගඵලයකින් යුත්, ට්‍රාන්ස්ෆෝමර් කාමරයකින් සහ ජල ටැංකි කාමරයකින් සමන්විත නව තනි මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමෙන් සමන්විත වේ. ගොඩනැගිල්ල මයික්‍රෝ පයිල් (micro pile) පදනම මත පදනම් වන අතර, සැහැල්ලු වානේ වහල ව්‍යුහයකින් සහ වහල තහඩුවලින් නිම කරනු ඇත.

   ස්ථානය: ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, අංක 363/12, සුගතදාස ක්‍රීඩාංගණය – D කොටස, ක්‍රීඩා සංකීර්ණ රථ ගාල පාර,, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.

   සම්පූර්ණ කාර්යය අවසන් කිරීම සඳහා ලබා දෙන කාලය දින දර්ශන දින 120 කි.

2. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය මගින් ලංසුකරණය මෙහෙයැවේ.

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු CIDA හෝ වෙනත් කිසිදු ලියාපදිංචි ආයතනයක් විසින් අසාධු ලේඛනගත කර නොතිබිය යුතු අතර පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය:

   ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා C6, C5 සහ C4 ශ්‍රේණි යටතේ ලියාපදිංචි වී තිබීම. ලංසුකරුට කිසියම් බැඳියාවන් අතර ගැටුමක් තිබේ නම්, ඔහු නුසුදුසු ලංසුකරුවෙකු ලෙස සලකනු ලැබේ.

4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතා:
   - පසුගිය වසර තුන තුළ ඉටුකරන ලද ඉදි කිරීම් කටයුතුවල සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම අවම වශයෙන් රුපියල් මිලියන 51 ක් විය යුතුය.
   - පසුගිය වසර පහ (5) තුළ ප්‍රධාන කොන්ත්‍රාත්කරුවෙකු ලෙස රුපියල් මිලියන 14 ක හෝ ඊට වැඩි ව්‍යාපෘති වටිනාකමකින් යුත් සමාන ස්වභාවයේ සහ සංකීර්ණත්වයකින් යුත් ගොඩනැගිලි ව්‍යාපෘතියක් සාර්ථකව නිම කර තිබීම.
   - මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවිය හැකි ඕනෑම අත්තිකාරම් මුදලක් හැර සහ වෙනත් කොන්ත්‍රාත්තු බැඳීම් සඳහා වෙන් කළ මුදල් හැර තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 10 කට නොඅඩු විය යුතුය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු කොළඹ 14 , සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, ක්‍රීඩා සංකීර්ණ රථ ගාල පාර, සුගතදාස ක්‍රීඩාංගණය – D කොටස, අංක 363/12, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, අධ්‍යක්ෂ ජනරාල්, (දුරකථන/ෆැක්ස්: 011-2328366) වෙතින් ලබා ගත හැකි අතර, 2026 අගෝස්තු 07 වන දින සිට 2026 සැප්තැම්බර් 01 වන දින දක්වා 09.00 පැය සිට 15.00 පැය දක්වා ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.

6. නැවත නොගෙවන ගාස්තුව ශ්‍රී ලංකා රුපියල් තුන්දහස් පන්සියයක් (රු. 3,500.00) ගෙවීමෙන් අනතුරුව ඉහත ලිපිනයෙහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් 2026 අගෝස්තු 07 වන දින සිට 2026 අගෝස්තු 31 වන දින දක්වා 09.00 පැය සිට 14.00 පැය දක්වා කාලය තුළ අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද ලංසු ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් ක්‍රමය මුදලින් විය යුතුය.

7. මුද්‍රා තබන ලද ලංසු පිටපත් දෙකකින් යුතුව, 2026 සැප්තැම්බර් 01 වන දින 14.00 පැය ට හෝ ඊට පෙර ලැබෙන සේ ඉහත ලිපිනයේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, සහභාගී වීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

8. ලංසු 2026 නොවැම්බර් 17 වන දින දක්වා වලංගු විය යුතුය. (ලංසු භාරගැනීමේ කාලය අවසන් කරනු ලබන දින සිට දින 77 ක්).

9. සියලුම ලංසු සමග ලංසු ඇපකරයක් (Bid Security) ඉදිරිපත් කළ යුතු අතර, එය ලංසු තැබීමේ ලේඛනයේ 9 වන කොටසේ ඇතුළත් ආකෘතියට අනුව, අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, අංක 363/12, සුගතදාස ක්‍රීඩාංගණය – D කොටස, ක්‍රීඩා සංකීර්ණ රථ ගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 යන නමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පිළිගත් වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රුපියල් එක් ලක්ෂ පනස් දහසක (රු. 150,000.00) වටිනාකමින් යුත් සහ 2026 දෙසැම්බර් 15 වන දින දක්වා වලංගු වන පරිදි (ලංසු භාරගැනීමේ කාලය අවසන් කරනු ලබන දින සිට දින 105 ක්) විය යුතුය.

10. පූර්ව ලංසු රැස්වීම 2026 අගෝස්තු 19 වන දින පෙ.ව. 10.00 ට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, අංක 363/12, සුගතදාස ක්‍රීඩාංගණය – D කොටස, ක්‍රීඩා සංකීර්ණ රථ ගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 හිදී පැවැත්වීමට නියමිත අතර, වැඩබිම් පරීක්ෂාව එදිනම පූර්ව ලංසු රැස්වීමෙන් අනතුරුව පැවැත්වේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය,**
**අංක 363/12, සුගතදාස ක්‍රීඩාංගණය - D කොටස,**
**ක්‍රීඩා සංකීර්ණ රථ ගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.**
**2026 අගෝස්තු 06 වන දින**